# 18

# අල්කුර්ආනය පාරායනය කරමු

## (සූරාවන්)



### සූරතුල් ෆීල්

මක්කී සූරාවක් වන, මක්කාවේ පහළ වූ වාක්‍ය 5 න් සමන්විත සූරාව වන්නේ සූරතුල් ෆීල් ය. නබිතුමා ඉපදුණු විට සිදු වූ ඉතා වැදගත් සිදුවීමක් ස්මරණය කරන අයුරින් මෙම සූරාව සැකසී ඇත.

අබ්‍රහා රජ කඃබාව කෙරෙහි ඊර්ෂ්‍යා කළේය. ජනතාව සමූහ වශයෙන් පැමිණ එය වන්දනාමාන කිරීම ඔහු නො රිස්සුවේ ය. එබැවින් කඃබාවට වඩා අලංකාර සිද්ධස්ථානයක් නිර්මාණය කළේ ය. එය කෙරෙහි ජනයා ඒකරාශි කිරීමට නන් අයුරින් උත්සාහ කළේ ය. නමුත් කිසිවෙක් එහි නො ගියේ ය.

එනිසා අවසාන වශයෙන් කඃබාවට පහර දී විනාශ කිරීමට සැලසුම් කළේ ය. ඒ සඳහා ශක්තිමත් ඇත් සේනාවක් නිර්මාණය කොට කඃබාව විනාශ කිරීම පිණිස මක්කාවට යවනු ලැබී ය.

එනමුත් අල්ලාහ් තම දේවස්ථානය විනාශ කරනු පිණිස පැමිණි අබ්‍රහාගේ ඇත් සේනාව කුඩා කුරුලු රංචුවක් මගින් විනාශ කළහ. මෙම කුරුල්ලෝ කුඩා ගල් කැට ඇතුන් වෙත විසි කළෝය. එමගින් ඇත්තු දැවී විනාශ වූහ.

අල්ලාහ් අබ්‍රහා හා ඔහුගේ ඇත් සේනාව විනාශ කළේ ය. අල්ලාහ්ගේ ශක්තිය හා හැකියාවත්, කඃබාවේ පූජනීයත්වයත් මේ මගින් පෙන්නුම් කෙරේ. ෆීල් යන්නෙහි අරුත ඇතා වේ. නබිතුමා ඉපදුණු වසර (ආමුල් ෆීල්) ඇත් වසර යනුවෙන් හඳුන්වනු ලබන්නේ මේ නිසා ය.

## සූරාව හා එහි අර්ථය


سُورَةُ الْفِيلِ مَكِّيَّةٌ وَهِيَ خَمْسُ آيَاتٍ

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

أَلَمْ تَرَ كَيْفَ فَعَلَ رَبُّكَ بِأَصْحَابِ الْفِيلِ ﴿١﴾ أَلَمْ يَجْعَلْ

كَيْدَهُمْ فِي تَضْلِيلٍ ﴿٢﴾ وَأَرْسَلَ عَلَيْهِمْ طَيْرًا أَبَابِيلَ ﴿٣﴾

تَرْمِيهِمْ بِحِجَارَةٍ مِنْ سِجِّيلٍ ﴿٤﴾ فَجَعَلَهُمْ كَعَصْفٍ مَأْكُولٍ ﴿٥﴾

අසීමිත කරුණාවන්ත, අපිරිමිත සෙනෙහෙවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි.)

1. (නබිවරයාණෙනි, අබ්‍රහාගේ) ඇත් සේනාව ඔබගේ නාථයාණන් කෙලෙස (විනාශ) කළේ දැයි ඔබ (සිතා බැලුවේ නැද්ද)

2. ඔවුන්ගේ කුමන්ත්‍රණය ඔහු නාස්ති කළේ නැත්ද?

3. ඔවුන් වෙත අබාබීල් කුරුල්ලන් සමූහ වශයෙන් ඔහු එවනු ලැබී ය.

4. (ගිනියම් වූ) කුඩා ගල් කැට ඔවුන් වෙත හෙලනු ලැබී ය.

5. එමගින්, ඔහු ඔවුන්ව කුරුල්ලන් සපා කෑ බීජ බවට පත්කොට (විනාශ කළේය)

අභ්‍යාස

1. මක්කාවේ පහළ කළ සූරාවන් කෙසේ අමතන්නේ ද?

2. ඇත් වසර අරාබියෙන් කෙසේ අමතන්නේ ද?

3. ඇත් හමුදාව විනාශ කළ කුරුලු රංචු හඳුන්වන නම කුමක්ද?

4. අල්ලාහ් ඇත් හමුදාවෙන් කඃබාව ආරක්ෂා කළ අයුරු කෙටියෙන් විස්තර කරන්න.

ක්‍රියාකාරකම

සූරතුල් ෆීල් හා එහි අර්ථය කට පාඩම් කරන්න.